# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2394/20 - 2024 ජූලි මස 23 වැනි අඟහරුවාදා - 2024.07.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි වූ 1978 වූ අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, මෙහි උපලේඛනයේ I තීරුවෙහි නිශ්චිතව දක්වා ඇත්තාවූ ද, එම උපලේඛනයෙහි II තීරුවෙහි අනුරූප සටහනෙහි සඳහන් මායිම් හා ඉම් සළකුණු නිශ්චිතව දක්වා ඇත්තාවූ ද, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, ඒ ප්‍රදේශය ඒ වගන්තියේ කාර්යය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

**ප්‍රසන්න රණතුංග** (පා.ම.),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2024 ජූලි මස 11 වැනි දින.
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
12 වන මහල,
''සෙත්සිරිපාය'' අදියර - II,
බත්තරමුල්ල,

1A - PG 6784 — 19 (2024/07)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

### *අරලගංවිල නාගරික සංවර්ධන ප්‍රදේශය*

*I වන තීරුව*

උතුරුමැද පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටියා වූ අංක 246 අරලගංවිල බටහිර, අංක 245 අරලගංවිල නැගෙනහිර හා අංක 238 පිඹුරත්තෑව බටහිර යන ග්‍රාම නිලධාරි කොට්ඨාස වලට අයත් වන්නා වූ දිඹුලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි II වෙනි තීරුවේ විස්තර වන සලකුණු හා මායිම් වලින් සමන්විත වූ මුළු මහත් භූමි ප්‍රදේශය.

*II වන තීරුව*

*උතුරට :*

අංක 246 අරලගංවිල බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම හා අංක 247 රත්මල් තැන්න ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම, වම් ඉවුර ප්‍රධාන ඇළ (ZD ඇළ) සමග ඡේදනය වන ආරම්භක ලක්ෂ්‍යයේ සිට අංක 246 අරලගංවිල බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ නැගෙනහිර හා උතුරු දිශානුගතව ගමන් කර B 502 මනම්පිටිය - අරලගංවිල - මාදුරුඔය මාර්ගය හා අංක 245 අරලගංවිල නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වාද එතැන් සිට අංක 245 අරලගංවිල නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිමේ සිට නැගෙනහිර දිශානුගතව එම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම වන කුඩා ඔය දක්වාද

*නැගෙනහිරට :*

අවසන්වරට සඳහන් කරන ලද මායිමේ සිට අංක 245 අරලගංවිල නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම හා කුඩා ඔය මායිම ඔස්සේ අංක 238 පිඹුරත්තෑව බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම දක්වාද එතැන් සිට අංක 238 පිඹුරත්තෑව බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ අරලගංවිල වැව් වානෙහි පිහිටි මධ්‍ය ලක්ෂ්‍යය දක්වාද

*දකුණට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අරලගංවිල වැව් ඉස්මත්තේ හා අංක 238 පිඹුරත්තෑව බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ B 502 මනම්පිටිය අරලගංවිල - මාදුරුඔය මාර්ගය හරහා පිඹුරත්තෑව ඇළ දක්වාද එතැන් පටන් එම ග්‍රාම නිලධාරී වසමේ දකුණු මායිම හා පිඹුරත්තෑව ඇළ ඔස්සේ ඊසාන හා බටහිර දිශානුගතව ගමන් කර අංක 246 අරලගංවිල බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම ඡේදනය වන ස්ථානය දක්වාද, එතැන් සිට අංක 246 අරලගංවිල බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ වම් ඉවුර ප්‍රධාන ඇළ (ZD ඇළ) දක්වාද

*බටහිරට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 246 අරලගංවිල බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බටහිර මායිම හා වම් ඉවුර ප්‍රධාන ඇල (ZD ඇළ) ඔස්සේ උතුරු දිශානුගතව ගමන් කිරීමේදී හමුවන ආරම්භක ලක්ෂ්‍යය දක්වා වූ මුළු මහත් ප්‍රදේශය.

EOG 07 - 0212

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.